# 7 ප්‍රායෝගික ලේඛන - II

දැන්වීම්, අත් පත්‍රිකා, පුවත්පත් වාර්තා ආදිය ලිවීමටත්, එවැනි ලේඛනවල ඇතුළත් තොරතුරු තේරුම් ගැනීමටත් අපට සිදු වේ. මෙම පාඩම සකස් කර ඇත්තේ ඒ පිළිබඳ ව අවබෝධයක් ලබා දීම සඳහා ය.

**දැන්වීමක්**

***පාසල් සංවර්ධන සමිති රැස්වීම***

බප/හෝ / සිරිවර්ධන මහා විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතියේ මහ සභා රැස්වීම 2006. 06. 23 වැනි දින පස්වරු 2.00 ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ. මෙම රැස්වීමේ දී විද්‍යාලයේ පුස්තකාලය ඉදිකිරීමේ කාර්යය ඇතුළු විශේෂ කරුණු කීපයක් පිළිබඳ සාකච්ඡා කර ගැනීමට නියමිත ය.

විදුහල්පතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මෙම රැස්වීම සඳහා සියලුම දෙමාපියන්ගේ සහභාගිත්වය අපේක්ෂා කෙරේ.

පාසල් සංවර්ධන සමිතිය,                ලේකම්

බප/හෝ/සිරිවර්ධන ම. වි.

## ක්‍රියාකාරකම්

1. ඉහත දැන්වීම ශබ්ද නගා කියවන්න.

2. දැන්වීමේ සඳහන් තොරතුරු ආශ්‍රයෙන් මේ ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

   i. මෙම දැන්වීම පළ කිරීමේ අරමුණ කුමක් ද?

   ii. රැස්වීම පැවැත්වෙන
      * දිනය :
      * වේලාව :
      * ස්ථානය :

      සඳහන් කරන්න.

   iii. රැස්වීමේ මුලසුන දරන්නේ කවුද?

   iv. රැස්වීමට සහභාගි විය යුත්තෝ කවරහු ද?

   v. මෙම දැන්වීම පළ කරන්නාගේ තනතුර කුමක් ද?

3. පහත දැක්වෙන්නේ පුවත්පතක පළ වූ දැන්වීමකි.

සිංහල සාහිත්‍යයට අපමණ සේවාවක් කළ
මහාගත්කරු
**කේ. ජයතිලක සූරීන්ගේ**
නිර්මාණ දිවිය අගැයුමට ලක්
කිරීමේ හා එතුමාට දීර්ඝායුෂ පැතීමේ
අරමුණින් පවත්වන
උපහාර උළෙලක්
**2006 ජූනි මස 26 වැනි දින**
**පස්වරු 4.00 ට**
කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ.
උත්සවයේ මුලසුන **මහාචාර්ය කඹුරුගමුවේ වජිර හිමියෝ** උසුලති.
ප්‍රධාන දේශනය **මහාචාර්ය සුචරිත ගම්ලත්**
මහතා විසින් පවත්වනු ලබන අතර මේ සඳහා
ඔබ සියලු දෙනාට ම ආරාධනා කෙරේ.

ලේකම්,
කේ ජයතිලක උපහාර කමිටුව

34, ජයපාර,
නුගේගොඩ.

A. ඉහත දැන්වීම ශබ්ද නගා කියවන්න.

B. දැන්වීමේ ඇතුළත් තොරතුරු යොදා ගෙන මේ ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. මෙම දැන්වීම පළ කිරීමේ අරමුණ කුමක් ද?

ii. රැස්වීම පැවැත්වෙන

* දිනය :
* වේලාව :
* ස්ථානය සඳහන් කරන්න.

iii. රැස්වීමේ මුලසුන දරන්නේ කවුද?

iv. රැස්වීමේ ප්‍රධාන දේශනය පවත්වන්නේ කවුරුන් ද?

4. පහත තොරතුරු ඇසුරින් දැන්වීමක් පිළියෙල කරන්න.

| | |
|---|---|
| දිනය | 2006 ජූනි මස 30 |
| ස්ථානය | අඹගස්පුර ප්‍රජා ශාලාව |
| වේලාව | පස්වරු 2.00 ට |
| අරමුණ | පානීය ජල ව්‍යාපෘතිය පිළිබඳ ව ගැමියන් දැනුම්වත් කිරීම |
| මුලසුන | ප්‍රාදේශීය ලේකම් චතුර වන්නිගම මහතා |
| දේශනය | 'ජල සම්පත රැක ගනිමු' |
| | මැයෙන් මහාචාර්ය විපුල හරිතවර්ණ මහතා |
| ආරාධනය | සියලුම ගම්වාසීන්ට |
| ආරාධනය කරන්නේ | ලේකම් |
| | ග්‍රාම සංවර්ධන සමිතිය |
| | අඹගස් පුර |

## පැවරුම්

1. පුවත්පතක පළ කිරීමට ඔබ කැමති කෙටි දැන්වීමක් පිළියෙල කරන්න.
2. පුවත්පත්වල පළ වන දැන්වීම් එකතු කර පොත් පිංචක් සකස් කරන්න.
3. ඔබ පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවයට අදාළ දැන්වීමක් සකස් කරන්න.